ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපනවේදී (නාට්‍ය හා රංගකලා ) උපාධි වැඩසටහන - පස්වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2014

ESU3226 - අධ්‍යාපනයෙහි පදනම

කාලය - පැය තුනයි.

---

දිනය - 2014.02.25 වේලාව - පෙ.ව.09.30 - ප.ව. 12.30

---

I වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, II වන කොටසේ ඕනෑ ම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## I වන කොටස

01. අධ්‍යාපන දර්ශනයෙන් ගුරුවරයාට ඇති ප්‍රයෝජන තුනක් (03) කෙටියෙන් විස්තර කරන්න.

02. 'අධ්‍යාපනය' සහ 'පුහුණුව' අතර වෙනස කෙටියෙන් විස්තර කරන්න.

03. මහත්මා ගාන්ධිගේ 'නයිතාලම්'(Naithalim) අධ්‍යාපන ක්‍රමයේ ප්‍රධාන මූලධර්ම තුනක් (03) දක්වන්න.

04. 'සාරධර්ම ' හා 'සදාචාරය' යන සංකල්ප පැහැදිලි කරන්න.

05. විධිමත් අධ්‍යාපනයේ ප්‍රධාන ගති ලක්ෂණ තුනක් (03) විස්තර කරන්න.

06. තම දරුවන් සමාජානුයෝගී කිරීම සඳහා දෙමාපියන් භාවිත කරන ක්‍රමශිල්ප දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

07. 'පරම්පරා අතර සංචලනය' යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි නිදසුනක් ඇසුරින් පැහැදිලි කරන්න.

08. ශ්‍රී ලංකා අධ්‍යාපන පද්ධතිය තුළ පාසලින් සිසුන් ගිලිහීමට බලපාන හේතු පහක් (05) දක්වන්න.

(ලකුණු 5 x 8 = 40)

## II වන කොටස

09. (i) ඉගැන්වීම් ක්‍රම පිළිබඳව ජෝන් ඩූවි සහ රූසෝ දැක්වූ අදහස් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 10)

(ii) වර්තමාන ශ්‍රී ලාංකික අධ්‍යාපන පද්ධතිය තුළ ඔවුන්ගේ අදහස් කොතරම් දුරට අදාළ වේදැයි නිදසුන් මඟින් සාකච්ඡා කරන්න. (ලකුණු 10)

10. (i) ප්‍රාථමික සමාජානුයෝජනය හා ද්විතියික සමාජානුයෝජනය අතර ඇති වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) සමාජානුයෝගි කාරකයක් ලෙස පාසලේ භූමිකාව සාකච්ඡා කරන්න. (ලකුණු 10)

11. (i) ශ්‍රී ලංකාවේ වර්තමාන තත්ත්වය යටතේ සාරධර්ම අධ්‍යාපනයේ ඇති වැදගත්කම අගයන්න. (ලකුණු 10)

(ii) ශ්‍රී ලංකාවේ පාසල් විෂයමාලාවට අන්තර්ග්‍රහණය කළයුතු සාරධර්ම තුනක් (03) කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 10)

12. (i) 'සංවර්ධනය යන සංකල්පය වසර ගණනාවක් තුළ පුළුල් වී ඇත.' මේ පිළිබඳව ඔබේ අදහස් දක්වන්න. (ලකුණු 10)

(ii) 'අධ්‍යාපනය පරිභෝජනයක්' වශයෙන් හා 'අධ්‍යාපනය ආයෝජනයක් වශයෙන්' යන ද්විවිධ ස්වභාවය විවේචනාත්මකව විභාග කරන්න. (ලකුණු 10)

13. (i) විධිමත්, නොවිධිමත් හා අවිධිමත් අධ්‍යාපන ක්‍රමවල වෙනස පෙන්වා දෙන්න.

(ලකුණු 10)

(ii) 'අවිධිමත් අධ්‍යාපන ක්‍රමයේ වාසි මෙන් ම අවාසි ද ඇත.' ඔබේ අදහස් දක්වන්න.

(ලකුණු 10)

14. පහත දැක්වෙන ඕනෑ ම මාතෘකා දෙකක් (02) පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) සමාජ සචලතාව

(ii) ප්ලේටෝගේ අධ්‍යාපන චින්තාවන්

(iii) අධ්‍යාපනය හා සමාජය

(iv) සිසු සාරධර්ම සංවර්ධනයේ දී ගුරු භූමිකාව

(ලකුණු 10 x 2 = 20)

- හිමිකම් ඇවිරිණි. -